# MONEY

# &

# FINANCIAL INSTITUTIONS

# (Part-VII)


***S. Madushanka***

***B.Sc (Mgt) Accounting (Special) (U.G)***

***University of of Sri Jayewardenepura***

# <u>විද්‍යුත් මුදල් (E - money)</u>

විද්‍යුත් ක්‍රමයට නැතහොත් පරිගණක ජාලයක් හරහා හුවමාරු වන මුදල් විද්‍යුත් මුදල් ලෙස සැලකේ. එහි ප්‍රතිඵලයක් වශයෙන් එක් පාර්ශ්වයකින් තවත් පාර්ශ්වයකට අරමුදල් මාරුවීමක් සිදු වේ. (Electronic Fund Transfer )

# <u>විද්‍යුත් මුදල් වර්ග</u>

- ණයපත් - Credit cards
- හරපත් - Debit cards
- පෙර ගෙවුම් කාඩ්පත් - Pre - paid cards
- ස්මාර්ට් කාඩ්පත් - Smart cards
- ක්ෂුද්‍ර පත් - Micro chips

ClassWork.LK

# ණයපත්

කිසියම් නිශ්චිත වටිනාකමක් දක්වා අනුමත වෙළෙඳ ආයතනවලින් භාණ්ඩ හා සේවා ලබා ගැනීමට හැකි වන පරිදි වාණිජ බැංකුවක් හෝ බලයලත් ආයතනයක් විසින් නිකුත් කරනු ලබන කාඩ්පත් විශේෂය ණයපත් ලෙස හඳුන්වයි.

**උදාහරණ :**

සී බෑන්ක් වීසා - ලංකා බැංකුව

පීපල්ස් වීසා - මහජන බැංකුව

මාස්ටර් කාඩ් - සම්පත් බැංකුව

සෙලාන් වීසා - සෙලාන් බැංකුව

ව්‍යාපාරිකයෙකුට ණයපතක් ඉදිරිපත් කළ විට එහි වලංගුභාවය සහ ණය සීමාව පරීක්ෂා කරී මට විද්‍යුත් සත්‍යාපන ක්‍රම ( Electronic verification systems ) යොදා ගැනේ. ව්‍යාපාරයේ ඇති යන්ත්‍රයට ණයපත ඇතුළත් කළ විට එම තොරතුරු ලබා ගත හැකි ය.

නමුත් විද්‍යුත් වාණිජ්‍යයේ දී ණයපත ඉදිරිපත් කිරීම අවශ්‍ය නො වන අතර අන්තර්ජාලය හරහා ණයපතෙහි

ClassWork.LK

තොරතුරු පමණක් ඉදිරිපත් කිරීමෙන් ගණුදෙනුව සිදු කළ හැකි ය.

## ණයපත් මගින් ගනුදෙනු කිරීමේ වාසි හා අවාසි

## ගනුදෙනුකරුවන්ට අත්වන වාසි

- ණයපතක් ලබා ගැනීම සඳහා ගිණුමක් තිබීම අවශ්‍ය නො වීම

- යම් කාලසීමාවක් දක්වා පොලී රහිත ණයක් වීම

- අනුමත සීමාව තුළ ATM යන්ත්‍ර මගින් මුදල් ලබා ගත හැකි වීම

- වට්ටම් හා ප්‍රසාද ලකුණු හිමි වීම

## ගනුදෙනුකරුවන්ට අත්වන අවාසි

- ණයපත සඳහා මුදල් ගෙවීම ප්‍රමාද වීමෙන් දඩ මුදලක් ගෙවීමට සිදු වීම

ClassWork.LK

- සෑම අලෙවිසැලකින් ම ගනුදෙනු සිදු කළ නො හැකි වීම

## ව්‍යාපාරිකයාට අත්වන වාසි

- ණයට විකුණුම් සඳහා මුදල් ලැබීම ස්ථීර වීම
- පිරිවැටුම වැඩි වීම නිසා ලාභය වැඩි වීම
- නොමිලේ ප්‍රචාරණයක් ලැබීම

## ව්‍යාපාරිකයාට අත්වන අවාසි

- බැංකුවට කොමිස් මුදලක් ගෙවීමට සිදු වීම
- විශේෂිත යන්ත්‍රයක් ස්ථාපිත කිරීමට සිදු වීම

ClassWork.LK

# හරපත්

බැංකු ගිණුම් හිමියෙකුට, තම ගිණුමේ ඇති මුදල් වෙළෙඳසැල් ගෙවීම් පියවීමට පැවරීම සඳහාත්, ටෙලර් යන්ත්‍ර භාවිතයෙන් මුදල් ආපසු ලබා ගැනීම සඳහාත් බැංකුව විසින් නිකුත් කරනු ලබන ප්ලාස්ටික් කාඩ්පත් විශේෂයකි. ගිණුමේ ඇති ශේෂය සඳහා පමණක් හරපත් හිමියාට ගනුදෙනු සිදු කළ හැකි ය.

**නිදසුන් :**

SET සම්පත් බැංකුව

PET මහජන බැංකුව

Catsupper කොමර්ෂල් බැංකුව

ClassWork.LK

## හරපත් මගින් ගනුදෙනු කිරීමෙන් ගනුදෙනුකරුවන්ට අත්වන වාසි

- ගිණුමේ ඇති මුදල් භාවිත කරන නිසා පොළියක් ගෙවිය යුතු නො වීම

- ගනුදෙනුව එම අවස්ථාවේ ම නිම වීම

- ATM යන්ත්‍ර හරහා මුදල් ලබා ගැනීම ද කළ හැකි වීම

## හරපත් මගින් ගනුදෙනු කිරීමෙන් ගනුදෙනුකරුවන්ට අත්වන අවාසි

- ගිණුමක් තිබීම අනිවාර්ය වීම

- ගිණුමේ ඇති ශේෂය දක්වා පමණක් ගනුදෙනු සිදු කළ හැකි වීම

ClassWork.LK

# පෙර ගෙවුම් කාඩ්පත්

කලින් මුදල් ගෙවා ලබා ගත හැකි කාඩ්පත් විශේෂයකි. මුදල් හෝ චෙක්පත් වෙනුවට ආරක්ෂාකාරී මෙන් ම පහසු විද්‍යුත් ගෙවීම් ක්‍රමයකි. බැංකු ගිණුම් නො මැති අයට පවා පෙර ගෙවුම් කාඩ්පත් භාවිතය මගින් විද්‍යුත් ක්‍රමයට ගෙවීම් කළ හැකි ය.

**නිදසුන් :**

දුරකථන කාඩ්පත්

Travell pass

ClassWork.LK

# ස්මාර්ට් කාඩ්පත්

මෙය integrated circuit card එකකි. මෙහි මුදල් වටිනාකමක් සහිත chip එකක් අනත්ර්ගත ය. මෙය භාවිත කර ගනුදෙනුවක් සිදු කළ විට එම ගනුදෙනුවේ වටිනාකම හර වී ශේෂය අඩු වේ. අදාළ නිකුතු ආයතනයට මුදල් ගෙවා වරින් වර මුදල් ගබඩා කර (Re-Loard ) ගත හැකි ය. ස්මාර්ට් කාඩ්පත මගින් ණයපතක, හරපතක, ATM කාඩ්පතක කාර්යයන් ද සිදු කළ හැකි අතර මෙය විද්‍යුත් මුදල් පසුම්බියක් (E-purse) ලෙස භාවිත කළ හැකි ය.

ClassWork.LK

# විද්‍යුත් මුදල් කාඩ්පත්වල දැකිය හැකි ලක්ෂණ

**<u>මුහුණත</u>**




- නිකුත් කරන ආයතනයේ නම හා ලාංඡනය

- කාඩ්පත් වර්ගය

  **නිදසුන් :** (Debit card, Credit card , ATM card)

- කාඩ්පත් අංකය

- සන්නම් ලාංඡනය (Brand Lago )

  **නිදසුන් :** VISA , Master

- කල් ඉකුත් වන දිනය

Class Work.LK

- කාඩ්පත් හිමියාගේ නම

<u>**පිටුපස**</u>




- කාන්දම් පටිය (Magnetic stripe)
- අත්සන් පටිය (Signature stripe)
- කාඩ්පත් ආරක්ෂිත සංකේතය ( card security code)
- ත්‍රිමාන චිත්‍රය (Holo gram)
- නිකුතු ආයතනයේ නම , ලිපිනය හා කොන්දේසි
- ගනුදෙනුකරු සේවා දුරකථන අංකය : (customer service hotline)

ClassWork.LK

# විද්‍යුත් මුදලින් ගනුදෙනු පියවීමේ දී සම්බන්ධ වන පාර්ශ්ව

- කාඩ්පත් හිමියා
- කාඩ්පත් නිකුත් කරන ආයතනය
- වෙළෙන්දා හෙවත් විකුණුම්කරු
- ණයපත් සංගමය

  **නිදසුන් :**

  වීසා, මාස්ටර්, ඇමරිකන් එක්ස්ප්‍රස් (AMEX)

ClassWork.LK

# විද්‍යුත් මුදලින් ගනුදෙනු කිරීමේ වාසි හා අවාසි

## වාසි :

- ගනුදෙනු කිරීමේ දී පිරිවැය අඩු වීම
- මුදලේ ආරක්ෂාව තහවුරු වීම
- දවසේ පැය 24 පුරා ම ගනුදෙනු කළ හැකි වීම
- ගෙවීම් කටයුතු පහසු වීම
- විවිධ ප්‍රතිලාභ හිමි වීම
- විදේශ ගනුදෙනු සඳහා ද භාවිත කළ හැකි වීම

ClassWork.LK

## අවාසි :

- පොළී, ප්‍රමාද ගාස්තු වැනි පිරිවැය දැරීමට සිදු වීම

- වංචනික ක්‍රියා සිදු වීම

- අනවශ්‍ය පරිභෝජන රටාවකට හුරු වීම

- තාක්ෂණික දෝෂ නිසා ගනුදෙනුවලට බාධා සිදු වීම

- සියලු ම ගනුදෙනුකරුවන්ට ගනුදෙනු කිරීමට හැකියාවක් හා ශක්තියක් නො මැති වීම

ClassWork.LK

2021
2022
2023

# උසස් පෙළ

ගිණුම්කරණය
ආර්ථික විද්‍යාව
ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

# සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## තනි හෝ කණ්ඩායම් පන්ති

## (English & Sinhala Medium)

# 0763655550

S. Madushanka
B.Sc (Mgt) Accounting (Special) (U.G)
University of of Sri Jayewardenepura